**ශීර්ෂය 193 - කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**

**-----------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්වාගණනය කළ මතය

**--------------------------**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 13 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**---------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------

22018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂ සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැක. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ .

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වලට අනුව මුදල් රෙගුලාසි 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අමාත්‍යාංශය වැය ශීර්ෂය යටතේ දරන ලද වියදම රු. 20,490,417 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයෙහි වියදම රු. 13,108,077 ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව අමාත්‍යාංශය කටයුතු කල යුතු වීම. | පිළිගනිමි. භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් අමාත්‍යාංශය වැය ශීර්ෂය යටතේ දරණ ලද වියදම පුනරාවර්තන රු. 3,616,439 ක් හා ප්‍රාග්ධන රු. 16,813,978 ක් ලෙස නිවැරදි විය යුතු බවට සටහන් කර ගතිමි. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීටමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සඳහා වෙනත් ලැබීම් ලෙස රු. 6,038,704 ක් දක්වා තිබුණද මාසික ගිණුම් සාරාංශ අනුව වෙනත් ලැබීම්වල වටිනාකම රු. 6,051,779 ක් බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය විසින් අදායම් නොවන ලැබීම් නිවැරදිව සටහන් කිරීමට කටයුතු කල යුතු වීම. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සඳහා වෙනත් ලැබීම් ලෙස රු. 6,038,704 ක් දක්වා තිබුණ ද මාසික ගිණුම් සාරාංශ අනුව වෙනත් ලැබීම්වල වටිනාකම රු. 6,051,779 කි. රු. 13,075 ක අගයක් අඩුවෙන් සටහන් වී ඇත. මාසික ගිණුම් සාරාංශයෙහි වෙනත් ලැබීම් රු. 13,075 ක මුදල නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |

**1.6.3 දේපල පිරියත උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි පෙන්වා තිබූ ආරම්භක ශේෂයන් හා ඉකුත් වර්ෂයේ අවසන් ශේෂයන් අතර රු. 43,948,452 වෙනසක් නිරීක්ෂණය විය. | දේපල පිරියත උපකරණ පිළිබඳ නිවැරදි හා සම්පූර්ණ වාර්තා පවත්වා ගත යුතු වීම. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි පෙන්වා තිබූ ආරම්භක ශේෂයන් හා ඉකුත් වර්ෂයේ අවසන් ශේෂයන් අතර වෙනසක් පවතින බව පිළිගනිමි. |
| (ආ) | 2016 වර්ෂයේදී කම්කරු නිල නිවාස ඉදි කිරීම සඳහා වැය කර තිබූ රු. 10,000,000 ක් එම වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබූ අතර, 2017 හා 2018 වර්ෂවලදීද ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ මෙම වටිනාකම ගිණුම්ගත කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හා භාණ්ඩාගාර වාර්තාවල ගොඩනැගිලි හා ඉදිකිරීම්වල වටිනාකම නිවැරදිව නිරූපණය වී නොතිබුණි. | දේපල පිරියත උපකරණ පිළිබඳ නිවැරදි හා සම්පූර්ණ වාර්තා පවත්වා ගත යුතු වීම. | 2016 වර්ෂයේ කම්කරු නිල නිවාස ඉදි කිරීම සඳහා වැය කර තිබූ වටිනාකම ගොඩනැගිලි හා ඉදිකිරීම් වල ඇතුලත් වී නොමැති බව පිළිගනිමි. එම වටිනාකම ඉදිරි වර්ෂයේදී නිවැරදි ලෙස ගොඩනැගිලි හා ඉදිකිරීම් වල ඇතුලත් කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ප්‍රාග්ධන වැය විෂයයක් යටතේ ජාතික වෘත්තීය සුරක්ෂිත හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයට යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනයෙන් එම ආයතනයේ අලංකරණ කටයුතු වෙනුවෙන් රු. 3,000,000 ක් වැය කර තිබුණි. අලංකාර වියදම යන්ත්‍ර උපකරණ යටතේ ගිණුම්ගත කර තිබූ නිසා යන්ත්‍ර හා උපකරණ අගය එම ප්‍රමාණයෙන් අධිතක්සේරු වී තිබුණි. | නිශ්චිත ප්‍රාග්ධන ප්‍රතිපාදනයන් එම කාර්යයන් සඳහාම යෙද වීමට කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. ඉදිරියේදී ගිණුම් කටයුතු නිවැරදිව සිදුකරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි. |
| (ඈ) | ජාතික වෘත්තීය සුරක්ෂිත හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය වෙනුවෙන් මිලදී ගෙන තිබූ රු. 4,054,277 ක විද්‍යාගාර උපකරණ, විද්‍යුත් උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වත්කම් විෂයයන් යටතේ ගිණුම්ගත කල යුතු වීම. | NIOSH ආයතනය විසින් මිලදී ගෙන තිබූ රු. 4,054,277 ක් විද්‍යා උපකරණ විද්‍යුත් උපකරණ යටතේ ප්‍රමාද දෝෂයකින් ගිණුම් ගත කර තිබූ බව පිළිගනිමි. |
| (ඉ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව 2018 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම වටිනාකම හා මූල්‍ය කාර්යසාධන වාර්තාවට අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වල වටිනාකම අතර රු. 6,676,310 ක වෙනසක් නිරීක්ෂණය විය. | එකම විෂය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වටිනාකම් සහ උපලේඛන වල ඇතුලත් සංඛ්‍යා එකිනෙක සමාන විය යුතු වීම | සටහන් කිරීමේදී ඇති වූ දෝෂයක් බවට පිළිගනිමි. එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට ඉදිරිපත් කර තිබූ වාර්තාව අනුව වෙනත් යන්ත්‍ර හා උපකරණවල වටිනාකම රු. 42,420,371 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට අනුව එය රු. 42,701,299 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 280,927 ක වෙනසක් නිරීක්ෂණය විය. | කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඇති වත්කම් ලේඛනය සහ අමාත්‍යාංශයේ වත්කම් ලේඛනය කාලීනව සමාලෝචනය කර යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව ආයතනය සතු සියලු වත්කම් ආරම්භක ශේෂයන් ලෙස CIGAS පරිගණක වැඩසටහනට ඇතුලත් කරන ලදී. මෙම රු. 280,927/- ක වෙනස කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය විසින් කොම්ට්‍රොලර් ජනරාල්ට ඉදිරිපත් කර තිබූ වාර්තාවේ ඇතුලත් වී නොතිබූ අයිතම කිහිපයක එකතුවකි. |

**1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවයෙන් විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකු ගෙන් අයවිය යුතු රු. 290,715 ක ණය ශේෂය වර්ෂ 05 ක සිට හිඟව පැවතුණි. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කලයුතු වීම | කළමණාකරණ සහකාර සේවයේ නියුතුව සිටි ඒ.ජේ.එම්.කෝරාල මයාගේ අය කර නොගත් හිඟ ණය ශේෂය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් නිරවුල් කිරීමට කටයුතු කර ගෙන යනු ලබයි. සේවය අතහැර ගොස් ඇති ඩබ්.ඩී.ජී.සී. සුගතදාස මියගේ හිඟ ණය මුදල අයකර ගැනීම සඳහා නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුව මඟින් කටයුතු ආරම්භ කර ඇත. |

**1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | අමාත්‍යාංශයේ අදහස් දැක්වීම |
|---|---|---|
| මෙහෙවර පියස ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මාණ කටයුතු ඉටු කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ එළඹ තිබූ රු. 97,594,204 ක් වූ ගිවිසුම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට අවශ්‍ය ලිපිගොනු විගණනයට ඉදිරිපත් | ජාතික විගණන පනතේ 42 වගන්තිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ප්‍රකාරව විගණනය කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන හා පොත්පත් විගණකාධිපතිට හෝ ඔහුගේ | පිළිතුරු ලබාදී නොතිබුණි. |

| | |
|---|---|
| නොකෙරිණි. | අධිකාරිය ලත් නිලධාරියෙකුට ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශය කටයුතු කළ යුතුවීම. |

**1.6.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | අමාත්‍යාංශයේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවීම. | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර එහි සඵලදායීතාව පිළිබඳව කලින් කළ සමාලෝචනය ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතේ VII කොටසේ 41 (2) වගන්තිය | යම් සේවකයෙකුට සිදුවන අනතුරකදී සේවායෝජක විසින් වන්දි ගෙවීම් පැහැරහැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලැබෙන මුදලින් සේවකයන් වෙත වන්දි ලෙස ගෙවීම සිදුකළ හැකි වේ. එලෙස වන්දි මුදල් අයකර ගැනීමට නොහැකිව වූ රු. 10,908,002 ක වරෙන්තු නිකුත් කර මාස 01 ක සිට මාස 117 ක් දක්වා කාල | වන්දි ආඥා පනතේ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාල මුදල් කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කල යුතුවීම. | කම්කරු වන්දි අධිකරණය මඟින් දෙනු ලබන තීන්දුව සමඟ නිකුත් කරන ඇස්කීසි වරෙන්තුව අදාල සේවායෝජක පදිංචි ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත යැවීමෙන් පසුව එම අධිකරණය විසින් එය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම නිසා වන්දි මුදල් අයකර ගැනීම ද ප්‍රමාද වී ඇත. මෙම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා කම්කරු වන්දි ආඥා |

| | | |
|---|---|---|
| ප්‍රමාදයක් සහිත නඩු ගොනු 40 ක් පැවතීම. | | පනතේ 41(1) හා 41(2) යන වගන්ති සංශෝධනය සඳහා දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **වියදම් කළමනාකරණය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයන් 37 ක් සඳහා වෙන්කර තිබූ රු. 258,927,400 ක ප්‍රතිපාදනයෙන් ඉතිරිය රු. 46,399,865 ක් විය. ඉන් සියයට 20 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක වූ ඉතිරිය රු. 26,834,988 ක ප්‍රමාණයක් වී තිබුණි. | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව හා ඵලදායීව පිළියෙල කිරීමට කටයුතු කලයුතු වීම. | ඉතිරිවීම පිළිගෙන තිබූ අතර එක් එක් වැය විෂයට අදාලව ඉතිරියට හේතු දක්වා තිබුණි. |
| (ආ) | මෙහෙවර පියස ගොඩනැගිල්ලේ අමාත්‍යාංශයට වෙන්කර දී තිබූ කොටසෙහි අභ්‍යන්තර නිර්මාණ කටයුතු වෙනුවෙන් වාර්ෂික ඇස්තමේන්තු මගින් රු. 200,000,000 ක ප්‍රතිපාදනයක් සලසා දී තිබුණ ද, සැලසුම් කල පරිදි මෙම කාර්යයන් 2018 වර්ෂයේදී නිම කල නොහැකි වීම නිසා එම ප්‍රතිපාදයෙන සියයට 90 ක් ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට නිසි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කල යුතු වීම. | සැලසුම් කර තිබූ කාලයට අදාළව ප්‍රධාන ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ වැඩ අවසන්ව නොතිබූ බැවින්, එම කොන්ත්‍රාත්කරු අමාත්‍යාංශයට අයත් මහල් විධිමත්ව භාර දීම ප්‍රමාදවීම හේතුවෙන් අභ්‍යන්තර නිර්මාණ කටයුතු ආරම්භ කිරීම ප්රමාද වූ බැවින් 2018 වර්ෂය තුළදී එම කටයුතු නිම කළ නොහැකිවිය. |
| (ඇ) | සේවකයන්ගේ වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා වූ ජාතික ආයතනය (**NIOSH**) සඳහා වෙන්කර තිබූ රු. 7,000,000 ක ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් වර්ෂය තුල වැයකර තිබුණේ සියයට 10 ක් පමණි. | ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට නිසි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කල යුතු වීම | NIOSH වෙන් කර තිබූ රු. මි. 7.0 ක ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් අක්මුදල් නොලැබීමේ හේතුව මත වර්ෂය තුළ වැය කර තිබුණේ 10% ක් පමණි. |
| (ඈ) | ප්‍රාග්ධන වැය විෂයන් 15 ක් සඳහා වෙන්කර තිබූ රු. 508,450,000 ක ප්‍රතිපාදනයෙන් | - එම - | ඉතිරිය සඳහා හේතු පැහැදිලි කර තිබුණි. |

සියයට 90 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක වූ රු. 508,330,100 ක ප්‍රතිපාදනය උපයෝජනය කර නොතිබුණි.

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් මෙහෙවර පියස ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මාණ කටයුතු වෙනුවෙන් 2018 වර්ෂයේදී පුද්ගලික ආයතනයක් සමඟ එළඹ තිබූ රු. 97,594,204 ක බැඳීම මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. එසේ වුවද 2018 දෙසැම්බර් 31 දින වන විට සේවාව සම්පූර්ණ කර ඇති බවට සහතික කර නොතිබුණු රු. 21,066,583 ක් වටිනාකමක් බැරකම් ලෙස පෙන්නුම් කර තිබුණි. | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පියවිය යුතු බැරකම් නිවැරදිව හඳුනාගෙන වටිනාකම් නිශ්චය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කල යුතුවීම. | අමාත්‍යාංශයේ මෙහෙවර පියස ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මාණ කටයුතු වෙනුවෙන් 2018 වර්ෂයේදී පුද්ගලික ආයතනයක් සමඟ එළැඹ තිබූ රු. 97,594,204 ක මූල්‍ය ප්‍රකාශන මඟින් පෙන්නුම් කළ යුතු වුවත් ප්‍රමාද දෝෂයකින් රු. 21,066,583 ලෙස ගිණුම්ගත කර තිබුණි. |
| | | - එම- | 2018.12.31 වන දින වන විට රු. 21,066,583 ක වටිනාකම බැරකමක් ලෙස පෙන්නුම් කර තිබුණි. නමුත් එම මුදල බැඳීමක් වන බැවින් ඉදිරියේදී එවැනි ගනුදෙණු බැඳීම් ලෙස සටහන් කිරීමට අදාළ නිලධාරින්ට උපදෙස් දෙන ලදී. |
| (ආ) | 2018 වර්ෂයේදී ප්‍රාග්ධන වැය විෂයයක් යටතේ ලබාගත් අතිරේක ප්‍රතිපාදනයන් මගින් 2017 වර්ෂයේදී වූ රු. 3,977,000 ක බැරකමක් නිරවුල් කර තිබුණද එම බැරකම ඉකුත් වර්ෂයේ විසර්ජන ගිණුම මගින් හෙළිදරවු කර නොතිබුණි. | අමාත්‍යාංශය විසින් පියවිය යුතු බැරකම් නිවැරදිව හඳුනාගෙන වටිනාකම් නිශ්චය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කල යුතුවීම. | 2017 වර්ෂයේදී රු. 3,977,000 බැරකමක් නිරවුල් කිරීම සඳහා 2018 වර්ෂයේදී ප්‍රතිපාදන උපයෝගි කරගෙන ගෙවීම් කරන ලදී. ප්‍රමාද දෝෂයකින් එම මුදල 2017 වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි. |

## 2.3 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක 6000/0000/00/0017/0026/000 දරන තැන්පත් ගිණුම මගින් වන්දි කොමසාරිස් කාර්යාලය 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ආපදාවකට හෝ මරණයට පත්වන සේවකයන් වෙනුවෙන් සේවා යෝජකයන්ගෙන් අයකර ඇතත් හිමිකරුවන්ට නොගෙවන ලද රු. 7,005,436 ක් ශේෂයක් පැවතුණි. | අදාල පාර්ශවයන් වෙත ගෙවීමට කටයුතු කල යුතු වීම | වන්දි හිමිකරුවන් තමන්ගේ හිමිකාරිත්වය නීත්‍යානුකූලව සනාථ කල පසු වන්දි ලබාදීමට කම්කරු වන්දි උසාවිය නියෝග ලබාදේ. නමුත් ඇතැම් හිමිකරුවන් ඔවුන්ගේ වන්දි බෙදීමේ පරීක්ෂණයට ඉදිරිපත් නොවන අතර, නීත්‍යානුකූල ලියවිලි ඉදිරිපත් නොකරයි. මෙම හේතු නිසා වන්දි ප්‍රධානය කිරීමට නොහැකි වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සබරගමුව ග්‍රාමීය සංවර්ධනයට සඳහා සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 500 ක ප්‍රතිපාදනයක් කළමණාකර තිබූ නමුත් 2018 මැයි මස සබරගමුව සංවර්ධන විෂයය අමාත්‍යාංශයෙන් ඉවත්කරන තෙක් අරමුණුගත කාර්යයන් සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධනය සම්බන්ධ සැලසුම් නිවැරදිව පිළියෙල කිරීමට අමාත්‍යාංශයේ අවධානය යොමු විය යුතු වීම. | 2017 – 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 6,094.92 ක් වන සංවර්ධන යෝජනා සැලැස්මක් සකස් කරන තිබූ නමුත් 2018 මැයි මාසයේදී එම විෂයය අමාත්‍යාංශයෙන් ඉවත් කරන තෙක් කිසිදු වියදමක් කර නොතිබුණි. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රැකියාවේ නියුක්තව සිටියදී සිදුවන මාරක හා මාරක නොවන අනතුරු අදාලව 2016 හා 2017 වර්ෂවලදී වන්දි කාර්යාලයට වාර්තා වී තිබූ පැමිණිලි 10 කට අදාල ලිපිගොනු පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාර්තා වී ඇති පැමිණිලි සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග කාර්යක්ෂමව හා කඩිනමින් වන්දි කොමසාරිස් කාර්යාලය ඉටු කල යුතු වීම | කම්කරු වන්දි අඥා පනත අනුව වන්දි අයකර දීමට ක්‍රියාකිරීමේදී නිවැරදි අධිකරණමය ක්‍රියාමාර්ග අනුගමනය කල යුතු අතර එහිදී යම් කාලයක් ගතවනු ඇත. |

**3.2 අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කම්කරු අමාත්‍යාංශය මාධ්‍ය ඒකකය සඳහා රු. 1,625,781 ක් වැය කර වීඩියෝ කැමරාවක් හා උපාංග මිලදී ගෙන තිබුණද එම කැමරාවේ තාක්ෂණයට අනුව ගැලපෙන ලෙස සංස්කරණ මෘදුකාංගයක් (Suitable editing software) සපයා නොතිබීම නිසා වීඩියෝ කැමරාව මිලදී ගැනීමෙන් අපේක්ෂා කල ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකිව තිබුණි. | අමාත්‍යාංශය විසින් සිදුකරන සියලු වියදම් සම්බන්ධයෙන් කාර්යක්මතාවය, ඵලදායීතාවය සහ පිරිමැසුම් බව යනාදිය පිලිබඳ සැලකිලිමත් විය යුතු වීම. | අදාල අංශයේ වැඩකටයුතු අඩාල වීම සහ අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් සංස්කරන මෘදුකාංගය මේ වන තෙක් මිලට ගැනිමට නොහැකි වී තිබේ. |

**4. යහපාලනය**

**4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වන්දි කොමසාරිස් කාර්යාලයේ | වයස් | එම ගිණුම් බොහොමයක් 1980 ට පෙර වර්ෂ වල සිට |

| | | |
|---|---|---|
| වර්ෂ 01 ක සිට වර්ෂ 25 කට වඩා වැඩි කාල පරාසයක සිට වයස් පූර්ණත්වයට පත් වූ බාලවයස්කරුවන් වෙත නිදහස් කල යුතු රු. 9,963,455 ක් වටිනා ගිණුම් 384 ක් විගණන දිනය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පූර්ණත්වයට පත් බාල වයස්කරුවන් වෙත කඩිනමින් අදාල මුදල් නිදහස් කිරීමට කටයුතු කළ යුතු වීම. | ආරම්භ කරන ලද ගිණුම් වන අතර ඒ සඳහා පදිංචි ලිපිනයන් වෙනස් වී තිබීම, ලිපිනයන් හැර යාම, ගිණුම් අයිතිකරුවන් විදේශ ගත වී සිටීම, යුද්ධය පැවති ප්‍රදේශවල ලිපිනයන් වෙනස් වීම, ගිණුම් හිමිකරුවන් මියගොස් සිටීම, වැනි හේතුන් නිරවුල් කළ නොහැකිව තිබුණි. 2016 වර්ෂයේ සිට දත්ත පද්ධතියක් ආරම්භ කර නිදහස් කිරීමේ ක්‍රියාමාර්ගය කඩිනම් කර ඇත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය පරිදි සමාලෝචිත වර්ෂයට අදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතු වීම. | 2018 වර්ෂයේ සැලසුම ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන නොමැති බව සහ 2019 වර්ෂය සඳහා මෙම පුහුණු සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන වෙන්කර ඇත්තේ 2019 අප්‍රේල් මාසයේදී බැවින් ඉදිරියේදී සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. |